# පෙරවදන

ශ්‍රී ලංකාව බහු ආගමික හා බහු ජනවාර්ගික රටකි. මෙම බහුත්වය තුළ විවිධ පාර්ශවයන් අතර මත වෙනස්කම් ඇතිවීම වැළැක්විය හැක්කක් නොවේ. නමුත් රටේ සාමය පවත්වාගෙන යන්නට නම් මෙම මත වෙනස්කම් එකිනෙකා අතර වෛරය හා ක්‍රෝධය ඇතිකර ගැනීමේ සාධකයක් බවට පත්කර ගත නොයුතුය. මෙවන් මත වෙනස්කම් ඇතිවන අවස්ථාවන්හි මෙම පාර්ශවයන් අතර අන්‍යෝන්‍ය අවබෝධය තුළින් ප්‍රශ්න සාකච්ඡා කිරීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වන්නේය.

ආගමික හා වාර්ගික කොටස් අතරේ නිරතුරුව මතුවන ප්‍රශ්න විග්‍රහ කිරීම පදනම් කරගෙන සකස්කර ඇති මෙම 'සමාජ සංවාද' ලිපි පෙළ අප සැමගේ අවධානයට යොමු විය යුතු වැදගත් ලිපි පෙළක් ලෙස දකින්නෙමි. සමාජ පාර්ශවයන් අතරේ අර්ථවත් සංවාදයක් සඳහා වූ සාමකාමී දොරටු විවෘත කොට අපගේ ප්‍රශ්න අප අතරේම විසඳා ගැනීමේ මාවතට යොමු කරන වැදගත් ලිපි පෙළක් ලෙස ද මෙය දකින්නෙමි.

මෙහි අන්තර්ගත වැදගත්, යථාර්ථවාදී හා තර්කානුකූල අදහස් අගයකොට සලකමි. උද්වේගය පසෙකලා ශ්‍රී ලාංකිකයින් වශයෙන් අපගේ සාම්ප්‍රදායික බැඳියාවන් හා සහෝදරත්වය ආරක්ෂා කර ගනිමින් අප අතරේ ඇති මත වෙනස්කම් විසඳා ගැනීමට මෙමගින් යහ ආරම්භයක් ඇති කර දී ඇති බව දකින්නට ඇත.

අපගේ මතය හා සමාකාර අයුරින් අන් අය මත දැරිය යුතු යැයි සිතීම සදාචාර සම්පන්න යහ පිළිවෙතක් නොවේ. මා දරණ මතයට පටහැනි මතයක් දැරීමට අන් අයට අයිතියක් ඇති බව රටේ මූලික නීතිය වූ රාජ්‍ය ව්‍යවස්ථාවෙන් ද සහතික කොට ඇත. එහෙයින් සංවාද තුළින් සම්මුතියක් ඇති කර ගැනීමට කටයුතු කරමු. එසේ කිරීමට දුෂ්කරතාවන් ඇති වන අවස්ථාවන්හි දී මගේ මතයට පටහැනි මතයක් දැරීමට අනිකාට පූර්ණ නිදහස හා අයිතියක් ඇතැයි යන මූලික මානව අයිතිවාසිකම් සිද්ධාන්තය පිළිගෙන සාමකාමීව කටයුතු කරන්නට කැප වෙමු. කෙසේ නමුත් මෙම ලිපි පෙළ මගින් අප සැමට නව චින්තන ප්‍රවේශයක් ලබා දී ඇතැයි යන්න පිළිගැනීමට කිසිම අපහසුතාවක් නොමැති බව මාගේ පිළිගැනීමයි.

සමාජ ප්‍රශ්න විසඳා ගැනීමට උචිතම පිළිවෙත සාමකාමී සංවාද බව මෙම ලිපි පෙළ අපට දැඩි ලෙස අවධාරණය කර සිටී.

ජයං වෙරං පසවති

දුක්ඛං සෙති පරාජිතෝ

උපසන්තෝ සුඛං සෙති

හිත්වා ජය පරාජයං (ධම්ම පදය)

අර්ථයː ජය ගන්නා පුද්ගලයා අනුන්ගේ වෛරය තමා වෙත යොමු කරවයි. පැරදුනු පුද්ගලයා දුකසේ වෙසෙයි. ජය පරාජය දෙකම අත්හැර සංසිඳීමට පත් පුද්ගලයා සුවසේ වාසය කරයි.

ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය ගලගම ධම්මරංසි හිමිපාණෝ
විහාරාධිපති
ශ්‍රී හත්බෝධි විහාරය
කිරුළ පාර - කොළඹ 05.

# හැඳින්වීම

'සාමය හා සංහිඳියාව වෙත යොමු වූ සමාජ සංවාද' ලිපි පෙළ සකස් කිරීමේ දී අප ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කළේ විවිධත්වයකින් අලංකෘත වූ ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ සුහදත්වය හා සාමූහිකත්වය ගොඩ නැඟීමේ උතුම් අරමුණ කෙරෙහිය.

විවිධ ජන වාර්ගික, ආගමික සහ සංස්කෘතික උරුමයන්ගෙන් පෝෂිත වූ අප සමාජය, සාමයේ හා සංහිඳියාවේ මාවතේ අඛණ්ඩව ගමන් කිරීමට නම් සියලු පාර්ශවයන් අතරේ අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් ව පවතී. අන්‍යෝන්‍ය අවබෝධය නොමැති විට එකිනෙකා පිළිබඳ සැකය, අවිශ්වාසය, බිය වැනි හානිකර ප්‍රවණතාවන් ගොඩ නැගෙන්නට ඇති ඉඩකඩ බහුලය. කිසිඳු දහමක් මෙවන් වියවුල් සමාජ තත්ත්වයන් අනුමත නොකරයි. එබැවින් සංවාදී සමාජ සම්බන්ධතාවක් මගින් අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කොට සමාජ සාමූහිකත්වය ගොඩ නැගීම යුගයේ අවශ්‍යතාවයක් ව පවතී.

එක් එක් දහම් හි වත් පිළිවෙත්, චර්යාවන් මෙන්ම සංස්කෘතික පැතිකඩයන් පිළිබඳව අප සියලු දෙනාම අවබෝධයක් ලබා ගැනීමේ ප්‍රයත්නයක නිරත වීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස දකින්නෙමු. එමෙන්ම සමාජ සංහිඳියාව ශක්තිමත් පදනමකින් ගොඩ නගන්නට නම් සෑම දහමක්ම එම දහමේ වැදගත් ඉගැන්වීම් පිළිබඳව අන් ආගමිකයින් දැනුවත් කිරීම ද වැදගත් වේ.

ඉස්ලාම් දහම මෙන්ම මුස්ලිම් සමාජය පිළිබඳව ද විවිධ වැරදි මත ඇති වී තිබෙන බව අපි ඉතා නිහතමානීව පිළිගන්නෙමු. එම වැරදි මතයන් ගැන කරුණු පහදා දී සත්‍ය තත්ත්වය අවබෝධ කර දීමේ වගකීම අප විසින් අතපසු කොට ඇති බව ද පිළිගන්නෙමු. ප්‍රමාද වී හෝ එම භාරධූර කාර්ය පිළිබඳව යමක් කිරීමට අවස්ථාවක් ලැබීම භාග්‍යයක් කොට සලකන්නෙමු.

මෙය සාධනීය සංවාදයක් සඳහා වූ දොරටු විවෘත කිරීමක් පදනම් කරගත් ලිපි පෙළක් හෙයින් මෙහි අන්තර්ගතයේ ඇති කරුණු පිළිබඳව ඔබගේ අවංක අදහස් දැක්වීම් අපි ඉතා අගය කොට සලකන්නෙමු.

විසංවාදී නොවී සංවාදී සමාජයක් තුළ සියලු කරුණු සාමකාමීව විසඳා ගැනීමට අධිෂ්ඨානශීලීව ක්‍රියා කරන්නට ලක් මවගේ සියලු දරුවන් වන අපි එකට අත්වැල් බැඳ ගනිමු. සෞභාග්‍යයෙන් පිරි සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩ නගන්නට අපගේ පූර්ණ දායකත්වය ලබා දෙමු.

**සැකසුම**


මව්ලවි මුර්ෂිඩ් මුලෆ්ෆර්
මව්ලවි මාහිර් රම්ඩීන්
මව්ලවි ඉර්ෂාද් හිල්මි
මව්ලවි නුඃමාන් ඔමර්

සහෝදර මොහොමඩ් දහලන්
සහෝදර අයාස් සාලිහ්

ඊ-මේල්: teamunityhub@gmail.com
විමසුම් සඳහා: +94 783 330 004, +94 722 009 002
අමතර පිටපත් සඳහා: +94 778 451 919, +94 779 481 919, +94 779 741 919
අන්තර්ජාල: www.unityhub.org

## අන්තර්ගතය

- ඉස්ලාමය ලොවෙහි පැතිරුණේ අසිපතෙහි බලයෙනි.
- දහම් පැතිරීම
- ජාත්‍යන්තර ව්‍යාපාරික කටයුතු හා දහම් පැතිරීම
    - ඉන්දුනීසියාව
- රජවරුන් දහම පිළිගැනීම හේතුවෙන් දහම් පැතිරීම
    - මාලදිවයින ඉස්ලාමීකරණය වීම
    - ශ්‍රී ලංකාවේ බුදු දහමේ ප්‍රවේශය
- රාජ්‍ය ව්‍යාප්තිය හා සංක්‍රමණය තුළින් දහම් පැතිරීම
    - ඇෆ්ගනිස්තානය
    - ස්පාඤ්ඤය
    - ඉන්දියාව
    - අරාබි කිතුනුවන්
- ප්‍රචාරක කටයුතු මගින් දහම් පැතිරීම
- ශ්‍රේෂ්ඨ චර්යාවන් මගින් දහම් ව්‍යාප්තිය

**ප්‍රශ්නය: බොහෝ ආසියාතික බෞද්ධ රටවල් බලෙන් ඉස්ලාමීයකරණයට පත්වීමේ ඉරණමට බෞද්ධ රටක් වූ ශ්‍රී ලංකාවත් ගොදුරු වේ ද?**

## පැහැදිලි කිරීම

### ඉස්ලාමය ලොවෙහි පැතිරුණේ අසිපතෙහි බලයෙනි.

ශත වර්ෂ ගණනකට පෙර බොහෝ ආසියාතික බෞද්ධ රටවල් බලෙන් ඉස්ලාමීයකරණයට පත් කරන ලද බවට බරපතල චෝදනාවක් මතු කර ඇත. එම චෝදනාව සමග ම මතු කරනු ලබන්නේ ශ්‍රී ලංකාව ද එවන් ඉරණමකට ලක්විය හැකි බව වූ භීතිකාවය. මෙම රටවල් බලෙන් ඉස්ලාමීයකරණය සඳහා යෙදූ බලයේ ස්වභාවය පිළිබඳව කිසිදු සඳහනක් එම චෝදනාවන් හි දක්නට නොමැත. මෙය අසිපතේ බලයෙන් හෝ සන්නද්ධ හමුදා මෙහෙයුමකින් එම රටවල් යටත් කර ගැනීමකින් සිදු වූවක් ද යන්න ගැන චෝදනා නගන්නන් විසින් පැහැදිලි කොට නොමැත. මෙසේ ඉස්ලාමීයකරණයට ලක් වූ රටවල් ලෙස ගෙන හැර දක්වනුයේ ඇෆ්ගනිස්තානය, මාලදිවයින, ඉන්දුනීසියාව වැනි රටවල්ය. මෙම චෝදනාවන් පිළිබඳව අපක්ෂපාතී විවෘත මනසකින් විචාරය හා බුද්ධිය මෙහෙයවා කරනු ලබන සාකච්ඡාවකට අප හා එක්වන ලෙස කාරුණිකව ආරාධනා කරන්නෙමු.

### දහම් පැතිරීම

සියලු දහම් ආරම්භයේ සිට පැතිරීමකට භාජනය නොවූ තත්ත්වයක පැවතියේ නම් වර්තමානයේ දක්නට ඇති ආකාරයේ දහම් ව්‍යාප්තියක් කිසිසේත්ම සිදු නොවන්නට තිබිණි. මෙම ධර්මතාව සියලු දහම් වලට පොදු වූ එකකි.

**"දහම් පැතිරීම"**, මෙය ඇසූ පමණින් සමාජයේ බොහෝ දෙනෙකුගේ සිතේ මැවෙන්නේ ඉතා අමිහිරි පිළිකුල් සහගත සිතුවිල්ලකි. ඒ අද සමාජයේ විද්වතුන් හා වගකිව යුත්තන් යැයි පවසා ගන්නා විවිධ පාර්ශවයන් එම වචනයට ආරූඪ කොට ඇති අර්ථයන් නිසාය. මෙම විෂය බුද්ධිමත් ලෙස විශ්ලේෂණය කළේ නම් සැබැවින්ම මෙහි නොසන්සුන් වීමට කිසිවක් නැත. මන්ද දහමක් පැතිරීම යනු මනුෂ්‍යාගේ චෛතසිකය සමග කරන ගනුදෙනුවකි. එය කිසියම් ආකාරයක බලපෑමකින් හෝ මුදලින් දිනා ගත හැකි කාර්යයක් නොවේ. එලෙස කිසිවකු බලපෑමකට හෝ මුදලට හෝ වෙනයම් කාරණයකට හෝ තම දහම අත්හරින්නේ නම් එයින් පැහැදිලි වන්නේ තමන් අත්හරින ලද දහම කෙරෙහි තිබෙන අනවබෝධය හෝ අවිශ්වාසය පමණි. විශේෂයෙන්ම අරාබි බසින් 'ඊමානය' යනුවෙන් හැඳින්වෙන 'විශ්වාසය', දහමේ පදනම ලෙස ඉස්ලාමය දක්වා ඇති හෙයින් එය කෙනෙකුගේ සිතට බලෙන් කාවැද්දිය හැකි දෙයක් නොවන බව ඕනෑම

අයෙකුට ඉතාම පහසුවෙන් තේරුම් කර ගත හැකි කරුණකි. එලෙසම එම "විශ්වාසය" කිසිවෙකුගේ චෛතසිකයෙන් බලෙන් ඉවත් කළ හැකි දෙයක් ද නොවේ. එය චෛතසිකය හා බැඳුණු ක්‍රියාවකි. මෙම 'විශ්වාසය' යථාර්ථයක් බව තම චෛතසිකයට ඒත්තු යන ආකාරයේ සාධක නොමැති නම් කිසිවෙකු ඉස්ලාමීය විශ්වාසය තුළ නොරැඳෙනු ඇත. මෙවැන්නක් කෙලෙස නම් බලය යොදා කළ හැකි ද යන්න විමසා සිටින්නට කැමැත්තෙමු.

බුදුන් වහන්සේ, ජේසුස් තුමා හා මුහම්මද් තුමා වැනි අති ශ්‍රේෂ්ඨ ආගමික නායකයින් එතුමන්ලාගේ ජීවිත කාලය තුළ සිදු කරනු ලැබුවේ තමන් විසින් සත්‍ය යැයි අවබෝධ කරගත් දාර්ශනික හා ධාර්මික සත්‍යයන් ජනයාට ප්‍රචාරණය මඟින් පැහැදිලි කර දෙන්නට කටයුතු කිරීමයි. එවන් මෙහෙවරයන් හි ප්‍රතිඵලයයි මීට සියවස් ගණනාවකට පෙර ලොව කුමක් හෝ ස්ථානයක ඉතාම සුළු පිරිසක් හමුවේ ප්‍රකාශ වූ දහම් අද වන විට සමස්ථ ලෝකයම වෙළා ගන්නට තරම් හේතු වී ඇත්තේ. එම දහම් ප්‍රචාරණයේ ආරම්භක අවධියේ එහි අරමුණ ඉහත සඳහන් ආකාරයේ බලය යෙදවීමක්, මුදල් හෝ වෙනයම් ලෞකික අරමුණක් වී පැවතුණේ නම් එය උපන් ගෙදරම මියැදෙන්නට තිබුණි. මෙලෙස බුදු දහමේ ව්‍යාප්තිය පිළිබඳව ඇති සටහනක් පහතින් උපුටා දක්වා ඇත්තෙමු.

"නූතන ලෝකයට බුදු දහම හඳුන්වා දීමට නැගෙනහිර හා බටහිර බෞද්ධ භික්ෂූන් වහන්සේගෙන් සිදු වූ සේවය අප්‍රමාණයි. මහා බ්‍රිතාන්‍යයේ බිහි වූ ආනන්ද මෙත්තේය (Allan Bennet) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබා මහ බ්‍රිතාන්‍යය තුළ බුදු දහම ප්‍රචලිත කිරීමට ඉමහත් කැපවීමක් කළ භික්ෂුවකි. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේ රාශියක් බුදු සමය ප්‍රචලිත කිරීමට පුරෝගාමී වූහ.

උන්වහන්සේ අතර නාරද, පියදස්සි, කිරින්දේ ධම්මානන්ද, හම්මලවල සද්ධාතිස්ස, බළන්ගොඩ ආනන්ද මෛත්‍රය යනාදී දැන උගත් ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේ ප්‍රධාන වෙති. ධර්ම දේශනා කිරීම, පිරිත් කීම, පොත්පත් රචනා කිරීම විවිධ ආගමික හා ශාස්ත්‍රීය කටයුතු මගින් බටහිර ජනතාවට ධර්ම රසඥතාව ජනිත කරවූවා පමණක් නොව ථේරවාද විහාරස්ථාන රාශියක් යුරෝපය පුරා බිහි කිරීමට හැකියාව ලැබිණි." (ආචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය.)
(http://dahamvila11.blogspot.com/p/blog-page_7.html)

මහින්දාගමනයෙන් ආරම්භ වූ ශ්‍රී ලාංකේය බුදු දහමේ ව්‍යාප්තිය දහම් ප්‍රචාරය මඟින් මහත් සේ සිදු වූවාක් බව ඉතිහාසය අපට සාක්ෂි දරයි. මේ පිළිබඳව වැඩි විස්තර මෙම ලිපියේ පසු තැනක ඉදිරි පත් කොට ඇත්තෙමු.

මෙලෙස තමන් අවබෝධ කරගත් සත්‍යය කෙලෙස නම් අන් ජනයා වෙත ළඟා වූයේ ද යන්න පිළිබඳව විමසුමක යෙදෙමින් මෙම සාකච්ඡාවට ප්‍රවේශයක් ලබා ගැනීම උචිත යැයි සිතන්නෙමු.

ඓතිහාසික තොරතුරු විමසා බැලීමේදී දහම් පැතිරීමට මුල් වූ කරුණු කිහිපයක් ඇති බව පෙනෙන්නට ඇත. මෙයට ප්‍රධාන හේතු වශයෙන් පහත සඳහන් කරුණු දැක්විය හැක.

1. ජාත්‍යන්තර වෙළඳ කටයුතු
2. පුරාණ යුගයේ පාලකයින් නව දහමක් වැළඳ ගැනීම
3. රාජ්‍ය ව්‍යාප්තිය හා සංක්‍රමණය තුළින් දහම පැතිරීම
4. ප්‍රචාරක කටයුතු
5. ශ්‍රේෂ්ඨ චර්යාවන්

## ජාත්‍යන්තර ව්‍යාපාරික කටයුතු හා දහම් පැතිරීම




ක්‍රි.ව. 1200-1600 කාල පරාසය තුළ මුස්ලිම් වරුන්ගේ වෙළඳ ජාලයේ ව්‍යාප්තිය දැක්වෙන සිතියමක්

අරාබි ජාතිකයින් අතීතයේ ජාත්‍යන්තර ව්‍යාපාරික හා නාවික කටයුතු පිළිබඳව ප්‍රසිද්ධියට පත්ව සිටියහ. තම ව්‍යාපාරික කටයුතු ඉතාම අවංක ලෙස ඉටු කිරීම හේතුවෙන් ඔවුන් සමඟ ගනුදෙනු කළ විවිධ රටවල්වල පාලකයින් හා ජනයා ඔවුන් ගැන මනා පැහැදීමකින් යුක්ත වූහ. මෙම අරාබි ජාතිකයින් වෙළඳාමට අමතරව වෛද්‍ය විද්‍යාව, යුද උපදේශක කටයුතු, රාජ්‍යතාන්ත්‍රික කටයුතු ආදියෙහි නිපුණතාවන් තිබූ අය වූහ. ඔවුන් පිළිබඳව අමතර පැහැදීමක් ඇති වීමට මෙම කරුණු ද හේතු වී ඇති බව පෙනෙන්නට ඇත. ශ්‍රී ලංකාවට ඉස්ලාමය පැමිණියේ ජාත්‍යන්තර වෙළඳාම හේතුවෙන් බව අප කවුරුත් දන්නා කරුණකි. අරාබි වෙළඳුන්ගේ අවංකකම මෙන්ම ඔවුන්ගේ අනෙකුත් හැකියාවන් ගැන පැහැදුණු සිංහල රජ දරුවන් ඔවුන්ට සිංහල කාන්තාවන් විවාහ කර ගැනීමට අවසරය ලබා දී මෙරටේ පදිංචි කරවා ගැනීමට කටයුතු කළ බව ඉතිහාසය අපට පැහැදිලි කරයි. මේ පිළිබඳව ඇති ඓතිහාසික තොරතුරු කිහිපයක් පහතින් දක්වා ඇත්තෙමු.

"අප කවුරුත් දන්නා පරිදි ශ්‍රී ලංකාවේ මුස්ලිම් වරුන්ගේ ආරම්භය පිළිබඳව මූලික ප්‍රභවයන් රැසක් දායක වී ඇත. ඒවා නම් ලංකාවට පැමිණි අරාබි වෙළඳුන්, මලබාර වෙළඳුන් සහ ජාවකයන්ය. මෙයින් අරාබි වෙළඳුන් සමඟ ශ්‍රී ලංකාවෙහි තිබුණු සබඳතාව පූර්ව ඉස්ලාමීය යුගය දක්වා ඇතට විහිදී ඇත. "ලංකාවේ රජ කළ පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ ඉතිහාසය ගවේෂණය කරන අපට ඒ ගැන සාධකයක් හමු වෙයි. එනම් පණ්ඩුකාභය රජු (ක්‍රි.පූ. 377-307) තම අගනුවර වූ අනුරාධපුරයෙහි යම් යම් ඉඩම්, අගනුවරට පැමිණි පූර්ව ඉස්ලාමීය යුගයේ අරාබි වෙළඳුන් වූ යෝනකයන් සඳහා වෙන් කළ බවයි. තවද අනුරාධපුර යුගයේ අගනුවර තුළ යවන (යොනුන් වාසය කළ) වීදි පවා තිබුණු බව ඉතිහාසයේ සඳහන් වේ. (මහාවංශය,10:90)" (මහාචාර්යය ලෝනා දේවරාජගේ "ශ්‍රී ලංකාවේ මුස්ලිම් වරු - සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය" 72 වැනි පිටුව)

ඉතිහාසය මේ කියන දෙය සත්‍යයක් නම් ශ්‍රී ලංකාවට පැමිණි විජය කුමාරයා සහ පිරිස මෙරටට ආ යුගයට පෙර හෝ ඊට පසු කාලයේ සිට අරාබි වරුන් මෙරටට පැමිණ මෙරට සමඟ ගනුදෙනු කරන්නට ඇත.

එමෙන්ම ලංකාවට පැමිණි අරාබි ජාතිකයන් දේශීය කාන්තාවන් සමඟ විවාහ වීම නිසා අරාබි සිංහල මිශ්‍ර දේහ ලක්ෂණ වලින් හෙබි සමාජයක් බිහි වන්නට ඇත. මෙම යෝනක සමාජයේ සිටි ඇතැම් ස්ත්‍රීන් සිංහල රජ වරුන්ගේ ආකර්ෂණයට පාත්‍ර වූවා පමණක් නොව ඇතැම් සංදේශ කාව්‍යයන් කළ කවීන්ගේ වර්ණනාවට පවා පාත්‍ර විය. පහළොස් වන ශත වර්ෂයේ සාහිත්‍ය කෘති වූ සංදේශ කාව්‍ය වල (කෝකිල සංදේශ වර්ණනාව, ඩබ්.එෆ්. ගුණවර්ධන, 74 වන කවිය සහ ගිරා සංදේශ විවරණය, මුණිදාස කුමාරතුංග, 104 වන කවිය) යොන් ලියන් හෙවත් මෙම අරාබි මිශ්‍ර යෝනක කාන්තාවන් ගැන සඳහන් වේ. මේ නිසා අරාබි වරුන් මෙරට සමඟ ගනුදෙනු කළේ මෑතක සිට නොවන බව සහ ඔවුන් විසින් මෙරට ජනාවාස කර ගත්තේද අද ඊයෙක නොවන බව ද පැහැදිලිය.

"තමා සිටි කාලයේ බේරුවල පදිංචි වී සිටි ඉතාම පැරණි මුස්ලිම් පවුල් වලින් එකක් සතුව පැවති පුරාණ අරාබි ලේඛනයක්, 1926 දී ලියන ලද "සෝනහාර්" නම් වූ සිය කෘතියෙහි ජේ. සී. වැන් සැන්ඩන් උපුටා දක්වයි. එහි දැක්වෙන පරිදි, යේමනයේ රජ පවුලකට අයත් පුතුන් දෙදෙනෙකු ක්‍රි.ව 604 දී ලංකාවට පැමිණ ඇත. ඉන් එක් තැනැත්තෙක් මන්නාරමට ගොඩ බැස අතර අනෙක් තැනැත්තා බේරුවල ගොඩ බැස එහි පදිංචි වී ඇත. ඔහුගෙන් පැවතෙන්නන් බැව් කියා පෑ මුස්ලිම්වරු කිහිප දෙනෙක්ම බේරුවල සිටියහ."



ක්‍රි.ව.920 මුලින්ම ඉදිකරන ලද ලංකාවේ මුල්ම මුස්ලිම් පල්ලිය ලෙසට සැලකෙන බේරුවල මස්ජිදුල් අබ්රාර් (මරදාන) පල්ලිය

(J.C Van Sanden 'Sonahar', A Brief History of the Moors of Ceylon, Colombo, 1926,pp.117-118)
(මහාචාර්ය ලෝනා දේවරාජගේ "ශ්‍රී ලංකාවේ මුස්ලිම් වරු - සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය" 68 වැනි පිටුව)

කෙසේ වුවද අපගේ අදහස නම් ලොව නා නා විධ ස්ථාන වලින් මෙරටට ගොඩ බැසි මුස්ලිම් වෙළඳුන් ලක්දිව කාන්තාවන් සමඟ විවාහ වී මෙරට මුල් බසින්නට ඇත. එලෙස මෙරට මුල් බැසි ඔවුන් විවිධ වූ ජන වර්ග වලට අයත් අයවලුන් වුවද සිය දහම ලෙස ඉස්ලාම් බැතිමතුන් වූයෙන් මුස්ලිම් ලෙස හැඳින්වෙන්නට ඇත. මේ අය දහමේ නාමයෙන් එක්ව පසුව මුස්ලිම් නමින් ජන වර්ගයක් ලෙස බිහි ව ඇති බවයි.

"මහාවංශයට ශතවර්ෂ තුනකට ඉහත සම්පාදනය කරන ලද ක්ලෝඩියස් ටොලමි ගේ භූගෝල ශාස්ත්‍රය අනුව ක්‍රි :ව 150 දී පිළියෙල කරගත් සිතියමක අරාබිවරුන්ගේ නදිය යන අර්ථයෙන් "සොනා ෆලුවියස්" යනුවෙන් අරාබිවරුන් 'දැදුරු ඔය' නම් කර තිබේ. ශ්‍රී ලංකාව සමඟ තිබූ ඔවුන්ගේ සම්බන්ධතාවේ ඉපැරණි බව එයින් ඔප්පු වේ. (මහාචාර්ය ලෝනා දේවරාජගේ "ශ්‍රී ලංකාවේ මුස්ලිම් වරු - සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය" 69 - 70 වැනි පිටු)

"වත්මන් සමාජයට අතීතය දෙස බැලීමෙන් ඉතිහාසයෙන් ලද හැකි ආදර්ශයන් බොහෝය. විශේෂයෙන් අතීතයේ අප රට තුළ තිබුණු ආගමික සහජීවනය අරභයා ලද හැකි පාඩම් බොහෝමයක් ඇත. විශේෂයෙන් උඩරට පාලන කාලය තුළ සහ ඊට පසුව මුස්ලිම්වරුන් සහ උඩරට සමාජය අතර තිබුණු සහසම්බන්ධය ඉතා විශිෂ්ටය." (මහාචාර්ය ලෝනා දේවරාජගේ "ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු - සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය" කෘතියෙන්)

ඉහතින් උපුටා දැක් වූ කරුණු අනුව ශ්‍රී ලංකාව සමඟ අරාබි වෙළඳුන්ගේ සබඳතාවය අවුරුදු 2400 කට වැඩි ඉතිහාසයකින් යුක්ත වන අතර මෙරටට ඉස්ලාමයේ පැමිණීම ක්‍රි:ව 604 දීම සිදු වී ඇති බව පැහැදිලිව පෙනෙන්නට ඇත.

ජාත්‍යන්තර වෙළඳාම් කටයුතු තුළින් ව්‍යාප්ත වී ඇත්තේ ඉස්ලාමය පමණක් නොව බුදු දහම ද එලෙසම ව්‍යාප්ත වී ඇති බව පහතින් උපුටා දක්වා ඇති කරුණු සනාථ කරයි.

1. "එසේම මුහුදු වෙළෙඳුන් හා සංචාරකයන් විසින් ද විශාල සේවයක් බුදු දහම බටහිරට ව්‍යාප්ත වීම උදෙසා සිදු කළ බව පැවසිය හැකිය." (ආචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය, කොළඹ විශ්ව විද්‍යාලය. (http://dahamvila11.blogspot.com/p/blog-page_7.html)
2. "For example, when Buddhist merchants visited and settled in



පැරණි සේද මාවත දැක්වෙන සිතියම

different lands, some members of the local populations naturally developed interest in these foreigners' beliefs, as with the introduction of Islam to Indonesia and Malaysia. Such a process occurred with Buddhism in the oasis states along the Silk Route in Central Asia during the two centuries before and after the common era".
**පරිවර්තනය:** "උදාහරණයක් වශයෙන් ඉන්දුනීසියාවට හා මැලේසියාවට ඉස්ලාමය හඳුන්වා දීම සිදු වූවාක් මෙන් බෞද්ධ වෙළඳුන් විවිධ රටවල් වලට පැමිණ එහි පදිංචි වූවායින් පසු එම රටවල් හි ජනයාගෙන් පිරිසක් මෙම විදේශිකයින්ගේ දහම පිළිබඳව උනන්දුවක් ස්වාභාවිකවම දක්වන්නට වූහ. පොදු යුගයේ ආරම්භයට ශත වර්ෂ දෙකකට පෙර හා පසුව ආසියාවේ සේද මාවත ප්‍රදේශයේ සරුසාර රටවල්හි බුදුදහම සම්බන්ධව එවැන්නක් සිදු විය."
(http://www.berzinarchives.com/web/en/archives/study/history_buddhism/general_histories/spread_buddhism_asia.html)

වෙළඳාම් කටයුතු මාර්ගයෙන් ඉස්ලාමීය ව්‍යාප්තිය ඉන්දුනීසියාව වැනි රට වලට බලපෑ ආකාරය පහත සඳහන් උදාහරණය මගින් විමසා බලමු. ඉහතින් උපුටා දැක් වූ කොටසේ ඉන්දුනීසියාවට හා මැලේසියාවට ඉස්ලාමය පැතිරුණේ වෙළඳාම මගින් බුදු දහම පැතුරුණු ආකාරයටම බව සඳහන් වී තිබීම ඉතාම වැදගත් කරුණකි. මෙයින් අදහස් වන්නේ චෝදනා කරන පරිදි ඉස්ලාමය මෙම රටවල් වලට බලෙන් ව්‍යාප්ත කරන ලද්දක් නොවන බවය.

## ඉන්දුනීසියාව

ඉස්ලාමයට පෙර වර්තමාන සම්පූර්ණ ඉන්දුනීසියාවම බෞද්ධ රටක් ලෙස පැවත නොමැත. එරටේ බොහෝ කොටස් හින්දු දහම අනුගමනය කොට ඇත. බෞද්ධ දහම පැතිරීමට ප්‍රධාන හේතුව හින්දුවරුන් අතර කරන ලද බෞද්ධ ආගමික ප්‍රචාර බව පැහැදිලි කරුණකි. මේ බව පහතින් උපුටා දක්වා ඇති කෙටි සටහනින් පැහැදිලි වේ.

"The pre-Islamic (Indonesian) Archipelago had a Hindu ruling class over a Buddhist-Hindu-animist matrix". (Prof. Dr. Nazeer Ahmed, PhD)
**පරිවර්තනය:** "පූර්ව ඉස්ලාමීය ඉන්දුනීසියානු දූපත් සමූහයේ බෞද්ධ හින්දු හා සර්ව ජීවවාදී පිරිසට ඉහළින් හින්දු පාලක පන්තියක් සිටියහ."
http://historyofislam.com/contents/the-post-mongol-period/islam-in-indonesia/

බලගතු මුස්ලිම් ඔටෝමාන් අධිරාජ්‍යයේ (13 - 19 සිය වස දක්වා) සහ මලබාර් වෙරළ තීරයේ රාජධානියන් හි ව්‍යාපාරිකයින්ව ආකර්ෂණය කර ගැනීමට පහසු මගක් ලෙස ඉන්දුනීසියාවේ මලක්කා සමුද්‍ර සන්ධිය අවට රාජධානියන් හි රජවරුන් ඉස්ලාමය වැළඳ ගත් බව ඉතිහාසය අපට පවසයි.

එලෙසම මුස්ලිම් ව්‍යාපාරිකයින් පිළිබඳවත් මෙම රජවරුන් අතරේ උසස් පිළිගැනීමක් තිබූ හෙයින් තම කුමාරිකාවන්ව ඔවුන්ට සරණ පාවා දෙන්නට ඉදිරිපත් වී ඇත. ඉහතින් සඳහන් කළාක් මෙන් පාලකයින් අතර ඇති වූ මෙම ආගමික වෙනස රට වැසියන් කෙරෙහි ද බලපෑමක් ඇති කළාට කිසිම සැකයක් නොමැත. මෙවන් කරුණු හැරෙන්නට ඉන්දුනීසියාව ආක්‍රමණය කරන්නට පැමිණි මුස්ලිම් හමුදාවක් පිළිබඳව ඉතිහාසයේ කිසිම සඳහනක් නොමැත. අසිපතක හෝ අන් බලපෑමකින් තොරව ඉස්ලාමය ඉන්දුනීසියාවේ පැතිර ගිය ද එරට බෞද්ධ හා හින්දු ආගමික ස්ථානයන් ආරක්ෂා කිරීමට ඔවුන් ක්‍රියා කොට ඇත.



දැනටත් ලෝක උරුමයක් ලෙස පැවතෙන ඉන්දුනීසියාවේ බොරෝ බුදූර් විහාරය

මධ්‍යම ජාවාහි නව වන සියවසේ නිර්මාණය කරන ලද ලොව විශාලතම "බොරෝ බුදූර්" බෞද්ධ ස්ථූපය අදත් යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස ආරක්ෂා කිරීමට ඉන්දුනීසියානු රජය කටයුතු කොට ඇත. මෑතකදී බංගලාදේශයේ සිට රාජ්‍යය ආරක්ෂාව යටතේ ශ්‍රී ලංකාවට වැඩම කරන ලද බුදුන් වහන්සේගේ කේශ ධාතූන් අපට හඬනගා පවසන්නේ මෙම මුස්ලිම් රටවල් බෞද්ධ ආගමික උරුමයන් සුරැකීමට කෙතරම් කටයුතු කර තිබේද යන්නය.

සෑම සමාජයකම දහමේ නාමයෙන් දහමේ ඉගැන්වීම් වලට පටහැනිව ක්‍රියා කරන පිරිසක් දැක ගත හැකිය. ඇතැම් රටවල්වල සමහර මුස්ලිම්වරුන් ද මෙසේ ඉස්ලාමීය ඉගැන්වීම් වලට පටහැනිව අන් ආගමිකයින්ට හා ආගමික ස්ථාන වලට හානිදායික අයුරින් කටයුතු කර ඇති බව අපි දනිමු. ඉස්ලාමීය ඉගැන්වීම් වලට පටහැනි මෙවන් අන්තවාදී ක්‍රියාවන් අපි දැඩි ලෙස හෙළා දකින්නෙමු. මෙවන් කළු බැටළුවන්ගේ ක්‍රියාවන් ඉස්ලාමය මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස නොගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටින්නට කැමැත්තෙමු.

## රජවරුන් දහම පිළිගැනීම හේතුවෙන් දහම් පැතිරීම

අතීතයේ බොහෝ ආසියාතික රටවල්වල පැවතියේ රාජාණ්ඩුය. වර්තමානයේ මෙන් ප්‍රජාතන්ත්‍රවාදී හා මානව අයිතිවාසිකම් නොතිබූ එම යුගයේ රජතුමාගේ පිළිවෙත අනුගමනය කිරීම රටවැසියාගේ පොදු සම්ප්‍රදාය විය. විශේෂයෙන් ම රජතුමාගේ දහම රාජ්‍ය දහම මෙන්ම රටවැසියාගේ ද දහම විය. මෙලෙස රජවරුන් නව දහමක් පිළිපැදීම හේතුවෙන් එම දහම එරට ව්‍යාප්ත වීමේ ඓතිහාසික තොරතුරු පහත සඳහන් උදාහරණය මගින් විමසා බලමු.

## මාලදිවයින ඉස්ලාමීකරණය වීම


ශ්‍රී ත්‍රිබුවන අදිත්යා රජු ඉස්ලාම් දහම වැළඳ ගැනීම දැක්වෙන ප්‍රකට සිතුවමක්

පළමුව බෞද්ධ රටක් ව පැවති මාලදිවයින ඉස්ලාමය වැළඳ ගත්තේ කෙසේද යන්න ඓතිහාසික තොරතුරු පදනම් කරගෙන විමසා බලමු.

මොරොක්කෝ ජාතික අබූ බරකාත් යූසුෆ් අල් බර්බරි නම් ඉස්ලාමීය විද්වතාගේ මැදිහත් වීමෙන් ක්‍රි.ව. 1153 දී මාලදිවයින රජු හා වැසියන් ඉස්ලාමය වැළඳ ගත් බව ඓතිහාසික තොරතුරු හෙළිදරව් කරයි. එවකට එහි රජකම් කළේ ශ්‍රී ත්‍රිබුවන අදිත්යා රජුය.

"රන්නමාරි" නම් වූ මුහුදු රාක්ෂසයෙකුට මසකට වරක් කන්‍යාවක් බිලි දෙන සම්ප්‍රදායක් එම රටේ තිබී ඇත. කුසපත් ඇදීම මගින් කන්‍යාවක් තෝරා ගැනීම සිරිත විය. වෙරළ ආසන්නව පිහිටා තිබූ විහාරයක් අසල මෙලෙස තෝරා ගත් කන්‍යාව සැන්දෑ වරුවේ නවතා යනු ලැබේ. මෙසේ නවතා ගිය තරුණියගේ තත්ත්වය බලන්නට එන පිරිසට පසු දින උදෑසන දකින්නට ලැබෙන්නේ ලිංගික දූෂණයට ලක් කොට මරා දමනු ලැබූ ඇගේ මළ සිරුරයි.

අබූ බරකාත් යූසුෆ් අල් බර්බරි තුමා නැවතී සිටි නිවසේ කන්‍යාව මෙලෙස කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලැබූ විට එම දැරිවිය බේරා ගැනීමට තීන්දු කළ එතුමා කාන්තා ඇඳුමින් සැරසී කන්‍යාවක් ලෙස වෙස්වලා ගෙන එම දිනයේ විහාරය අසල සිටින්නට කටයුතු කළේය. එතුමා එම ස්ථානයේ සවස් කාලයේ සිට සිහින් හඬින් අල් කුර්ආනය පාරායනය කරන්නට ආරම්භ කොට සිදු වන්නට යන තත්ත්වය පිළිබඳව තැකීමකින් තොරව ඉතා තැන්පත්ව සිට ඇත. පසු දින උදෑසන එතැනට පැමිණි ජනයාට දැක ගන්නට ලැබී තිබුණේ එම අවස්ථාවේදීත් අල් කුර්ආනය පාරායනය කරමින් සිටි අල් බර්බරි විද්වතාය. මෙම ආශ්චර්යමත් සිද්ධියෙන් පසු මෙතෙක් කරන ලද කෲර බිලි පූජාව රජතුමා විසින් සම්පූර්ණයෙන්ම අහෝසි කරන ලදී. එමෙන්ම මෙයින් පැහැදුනු රජතුමා ඉස්ලාමය අධ්‍යයනය කොට ඉස්ලාම් දහම වැළඳ ගන්නා ලදී. එයත් සමඟම රජ පවුලේ සියල්ලන් ඉස්ලාමය වැළඳ ගත් අතර ඉන් පසුව රජතුමා ව අනුගමනය කරමින් රටවැසියන් ද ඉස්ලාමය වැළඳ ගන්නා ලදී. ගවේෂකයෙකු වූ ඉබ්නු බතූතා විසින් ද මෙම ඓතිහාසික සිද්ධිය පිළිබඳ තොරතුරු සටහන් කර ඇත.
http://ambeblog.wordpress.com/2010/01/26/conversion-of-the-maldives-to-islam/
http://www.vermillionmaldives.com/maldives-history.htm

ඉස්ලාමයට එරෙහිව චෝදනා ගොනු කරමින් සිටිනා පිරිස පවසන අයුරු මෙහි ඉස්ලාමය පැතිර වීමට ඉදිරිපත් වූ හමුදාවක මැදිහත් වීමක්, අසිපතක බලය පෙන්වීමක් ආදී ඉස්ලාමයට පටහැනි ක්‍රියා මාර්ග කිසිවක්

උපයෝගී කරගෙන නොමැති බව ඉතාම පැහැදිලිව සනාථ වන සත්‍යයකි. මෙම තොරතුරු සමඟ ශ්‍රී ලංකාද්වීපය බුදු දහම වැළඳ ගැනීමේ පුරාවෘතය සසඳා බලමු.

## ශ්‍රී ලංකාවේ බුදු දහමේ ප්‍රවේශය

'අශෝක සිරිත'ට අනුව කාලිංග යුද ජයග්‍රහණයෙන් ලත් අත්දැකීම් ඔස්සේ බුදු දහම වැළඳගත් ධර්මාශෝක රජු විසින් බෞද්ධ ධර්ම දූතයන් වහන්සේලා විදේශීය රටවල් රාශියකට බුදු දහම ප්‍රචාරය කිරීම සඳහා පිටත් කර හැරීම සිදු කරන ලදී. එසේ යැවූ රටවල් අතර ශ්‍රී ලංකාව ද එකකි.



මිහිඳු මහ රහතන් වහන්සේ සහ තම ධර්ම දූත පිරිස වැඩම කළ මිහින්තලා පව්ව

ලංකාවට වැඩම කළ බෞද්ධ ධර්ම දූත පිරිස සත් දෙනෙකුගෙන් සමන්විත වූ අතර එහි ප්‍රධානත්වය දැරුයේ ධර්මාශෝක රජතුමාගේ පුතෙකු වූ මිහිඳු මහ රහතන් වහන්සේය. මේ ධර්ම දූත පිරිස ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වන්නේ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දීය. "මහින්දාගමනය" යනුවෙන් අප කථා කරන්නේ මේ බෞද්ධ ධර්ම දූත කණ්ඩායමේ ශ්‍රී ලංකා සම්ප්‍රාප්තියයි.

මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මණ ආගම, වෘක්ෂ ඇදහිලි, යක්ෂ ඇදහිලි, ජෛනාගම, ලිංග පූජාව වැනි ඇදහිලි පැවති බව ඓතිහාසික තොරතුරු මගින් හෙළිදරව් වේ. මහින්දාගමනයෙන් බුදු දහම රාජ්‍ය දහම හා රටවැසින්ගෙන් බහුතරයකගේ දහම බවට පරිවර්තනය වූ බව පැහැදිලිය.

මහින්දාගමනයේ අරමුණු මොනවාදැයි අප තේරුම් ගත යුතුය. මිහින්තලයේ දී දෙවන පැතිස් රජුට මුණ ගැසුණු මිහිඳු මාහිමියන් තම ගමනේ අරමුණු පැහැදිලි කරන්නේ මෙසේය.

*'සමණාමයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා*

*තමේව අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා'*

(මහරජතුමනි, අපි ධර්ම රාජයාණන් වහන්සේගේ (බුදුන් වහන්සේගේ) ශ්‍රාවකයෝ වෙමු. ඔබට අනුකම්පාවෙන්ම දඹදිව සිට මෙහි පැමිණියෙමු.) මෙය එහි සරල අර්ථයයි.

මිහිඳු මාහිමියන් වදාළ පරිදි උන්වහන්සේ මෙහි වැඩම කරන්නේ ධර්මාශෝක අධිරාජයාගේ රාජකීය නියෝජිතයකු ලෙස නොව ධර්මරාජයන් වහන්සේගේ එනම් බුදුන් වහන්සේගේ ශ්‍රාවකයකු ලෙසය. ඒ රාජ්‍ය තාන්ත්‍රික කාර්යයක් උදෙසා නොව ශ්‍රී ලංකාවේ රජතුමා ඇතුලු රටවැසියන් වෙනුවෙන් ධර්ම ප්‍රචාරක කටයුතු කිරීම උදෙසාය. මෙලෙස දේවානම් පියතිස්ස රජතුමා

මිහිඳු මහ රහතන් වහන්සේගේ ධර්ම දේශනා පිළිගෙන බුදු දහම වැළඳ ගත් බව බෞද්ධ ඉතිහාසය අපට දන්වා සිටී. දේවානම් පියතිස්ස රජතුමා බුදු දහම වැළඳ ගැනීමත් සමඟ රටවැසියන් ද එම මග අනුගමනය කරමින් බෞද්ධ ශ්‍රාවකයින් බවට පත් වූහ.

මාලදිවයින ඉස්ලාමය වැළඳ ගැනීමත් ශ්‍රී ලංකාද්වීපය බුදු දහම වැළඳ ගැනීමත් අතර අනුබද්ධිත කාරණා පිළිබඳ වෙනස්කම් තිබුනත් සිද්ධීන් දෙකේ හරය දෙස අවධානය යොමු කිරීමේදී අපට දක්නට ඇත්තේ කුමන වෙනස්කම් ද කියා විමසන්නට කැමැත්තෙමු. මෙම දෙරටේ ආගමික පරිවර්තනය අතර හරයේ එනම් දෙරටේ රජවරුන් නව දහම් පිළිගැනීම සම්බන්ධයෙන් සමානතාවක් ඇතත් මාලදිවයිනෙහි පරිවර්තනය වැරදි ලෙසත් ශ්‍රී ලාංකේය පරිවර්තනය නිවැරදි ලෙසත් දැකීම කෙතරම් යුක්ති සහගත හා සාධාරණ නිගමනයක් ද යන්න විමසා සිටින්නට කැමැත්තෙමු.

අතීතයේ එසේ පාලකයාගේ දහම අනුගමනය කිරීමට රටවැසියා පෙළඹුන ද වර්තමානයේ එවැන්නක් සිදු වීමට ඇති ඉඩකඩ කිසිසේත්ම නොමැති තරම්ය. අතීතයට පමණක් සීමා වූ මෙවන් සංසිද්ධීන් ඉදිරිපත් කොට ඉස්ලාමයට පමණක් චෝදනා කරමින් කටයුතු කිරීම කෙලෙස නම් යුක්ති සහගත වන්නේ ද? මෙවන් අස්ථාන බියක් මෙරට ජනයාගේ සිත්සතන් තුළ ඇති කිරීමට කටයුතු කිරීම නුසුදුසු ක්‍රියාවක් ලෙස අපි දකින්නෙමු. එය හුදෙක් පටු අරමුණු ඉටු කර ගැනීම සඳහා ජනතාවට සංවේදී කරුණු වැරදි ලෙස යොදා ගැනීමක් බව අපගේ වැටහීමයි. එම නිසා සමාජය මහා බිය කරු තෝතැන්නක් කරා ගෙන යාමේ අවධානමක් ගොඩ නැඟී ඇත.

## රාජ්‍ය ව්‍යාප්තිය හා සංක්‍රමණය තුළින් දහම් පැතිරීම

අතීතයේ රටවල් යටහත් කර ගැනීම සම්ප්‍රදායක් ව පැවතිනි. පෘතුගීසීන්, ලන්දේසීන් හා ඉංග්‍රීසීන් අප රට යටහත් කර ගැනීමට පැමිණි විදේශ රාජ්‍යයන්ය. ඔවුන්ගේ පාලන කාල වකවානුව තුළ පාලකයින්ගේ දහමේ ව්‍යාප්තියක් සිදු වූ බව සත්‍යයකි. අතීතයට පමණක් සීමා වූ මෙවන් සිද්ධීන් වර්තමානයේ කෙලෙසවත් සිදුවිය නොහැකි බව අප සැවොම හොඳින් දන්නා කරුණකි.

පහතින් උපුටා දක්වා ඇති කොටසින් ද රාජ්‍ය ව්‍යාප්තිය මෙන්ම සංක්‍රමණයන් මගින් ද සිදුවන සම්මිශ්‍රණය මගින් දහම් ව්‍යාප්ත වීම පිළිබඳ කරුණු විග්‍රහ කොට ඇත.

**"යුද්ධය කොතරම් කුරිරු වුවත් සමහර විට ඉන් සිදුවන යහපත් ප්‍රතිඵල ද වේ. රජුන් විසින් රටවල් ආක්‍රමණය කළ පසු සංස්කෘතික හා දාර්ශනික චින්තාවන් අතර සිදු වන සම්මිශ්‍රණය නොවැළැක්විය හැකිය.**

**බෞද්ධයන්ගේ දේශාන්තර සංක්‍රමණ බුදු දහමේ ජාත්‍යන්තර ව්‍යාප්තියට තුඩු දුන් තවත් ප්‍රබල සාධකයක් වශයෙන් පෙන්වා දිය හැකිය. දේශපාලන කැරලි කෝලාහල හා යුද්ධමය පසුබිම යටතේ ජනතාව ඒ ඒ රටවල් අතහැර වෙනත්**

**රාජ්‍යයන්ට සංක්‍රමණය වීමේ දී තම සංස්කෘතික ආගමික විශ්වාසයන් ද රැගෙන යති. ඒ අනුව 1949 චීනයේ අභ්‍යන්තර කැරලි කෝලහාල ද 1959 ටිබෙටයේ යුදමය වාතාවරණය ද, 1970 දශකයේ වියට්නාම් කාම්බෝජ හා ලාඕස් යන බෞද්ධ රාජ්‍යයන් හි සිදු වූ අභ්‍යන්තර දේශපාලන හා යුදමය නොසන්සුන්තාවන් ද විශාල වශයෙන් බෞද්ධයෝ තම උපන් භූමීන් අතහැර යුරෝපීය රටවලට සංක්‍රමණය වීමට හේතු විය. එකී සාංක්‍රමණික ජනතාව අතරට බෞද්ධ භික්ෂූන් ද අයත් වීම නිසා ඒ ඒ ප්‍රදේශවල බෞද්ධාගමික සිද්ධස්ථාන ඉදි කර ගන්නා ලදී. දලයිලාමා තුමා ඉන්දියාවට පැමිණ පදිංචි වීමෙන් වර්තමාන ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවල ටිබෙට් බුදු සමය මුල් බැස ගෙන තිබෙන ආකාරය මැනවින් දැක ගත හැකිය. නේපාලයේ කත්මණ්ඩු නගරය අවට කඳු වැටිවල ගුරු පැහැයෙන් ඉදි කර තිබෙන ලාමා පන්සල් නේපාලයට ටිබෙට් බුදු දහමේ බලපෑම කෙතරම් දැයි සිතා ගත හැකිය.”**

(ආචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය, කොළඹ විශ්ව විද්‍යාලය.)

http://dahamvila11.blogspot.com/p/blog-page_7.html

## ඇෆ්ගනිස්තානය

නබි තුමාගේ ඇවෑමෙන් පසු අරාබි කරය පාලනය කළ පාලකයින් විසින් ලොව අන් පාලකයින් සිය පාලනය ව්‍යාප්ත කළ ස්වරූපයෙන්ම තම පාලනය ව්‍යාප්ත කිරීම සඳහා ලෝකයේ විවිධ රටවලට ගොස් ඇත. එලෙසම ඇෆ්ගනිස්තානය ආශ්‍රිත ප්‍රදේශ වලටද මොවුන් අවතීර්ණ වී ඇත. එහි දී ඔවුන් එම රටවල ක්‍රියාත්මක කළ ඉස්ලාමීය රාජ්‍ය පාලන ක්‍රමයේ සාධනීය ලක්ෂණ කෙරෙහි පැහැදුනු රටවැසියා ක්‍රමයෙන් සිය කැමැත්තෙන් ඉස්ලාමය වැළඳ ගත්හ. නමුත් පාලනය කළ මුස්ලිම්වරුන් එහි වැසියන් ව බලහත්කාරයෙන් ඉස්ලාමයට හරවා ගැනීමේ ක්‍රියාවක නියැලුණු බවට ඓතිහාසික අව්‍යාජ සාක්ෂි කිසිවක් අප දන්නා තරමින් නොමැත. ඇයිදයත් එසේ කිරීමට ඉස්ලාමීය ඉගැන්වීම් තුළ කිසිම අනුමැතියක් නොමැති හෙයිනි. ඇෆ්ගනිස්තානය පාලනය කළ මුස්ලිම්වරුන් එහි වැසියන්ට තම දහම නිදහසේ පිළිපදින්නට අවශ්‍ය පූර්ණ නිදහස ලබා දී තිබූ බව ඓතිහාසික තොරතුරු දන්වා සිටී.


දැනට ලෝක උරුමයක් ලෙස පැවැතෙන ඇෆ්ගනිස්තානයේ **මෙස් අයනක් ස්ථූපය**

“ක්‍රි. ව. 680 දී චීන වන්දනාකරුවෙකු වූ යීජින්ග් (Yijing) පවසන පරිදි ඇෆ්ගනිස්තානයේ ප්‍රධාන බෞද්ධ විහාරස්ථානය වූ නව විහාරය මුස්ලිම් පාලනය යටතේ සර්වස්තිවාද බුදු දහමේ ශ්‍රේෂ්ඨ මධ්‍යස්ථානයක් ලෙස සුරක්ෂිතව වැජඹුන බව සඳහන් වේ.

අල් කර්මානි නම් මුස්ලිම් ලේඛකයා නව විහාරය පිළිබඳව අටවන සියවස ආරම්භයේ ලියන ලද තොරතුරු අල් හමදානි නම් ලේඛකයා විසින් ඔහුගේ "කිතාබ් අල් බුල්දාන්" නම් ග්‍රන්ථයට ඇතුලත් කොට තිබුණි. ඉස්ලාමිකයින්ගේ ප්‍රධාන ආගමික මධ්‍යස්ථානය වූ මක්කාවේ ඇති කඃබාව නම් වූ පුරාතන මස්ජිදය හා සමාකාර ලෙස නව විහාරයේ සැලසුම සකස් කොට තිබූ බව එම ග්‍රන්ථයේ සඳහන් වේ."
http://www.berzinarchives.com/

ඉස්ලාමීය පාලනය යටතේ ඇෆ්ගනිස්තාන් වැසියන්ගේ ආගමික නිදහස සුරක්ෂිත කොට තිබූ ආකාරය පිළිබඳව තව බොහෝ තොරතුරු ඉදිරිපත් කළ හැක. එහි වැසියන් ඉස්ලාමය වැළඳ ගැනීම ඔවුන්ගේම කැමැත්ත පරිදි සිදු වූවක් විනා බලහත්කාරයෙන් සිදු කරන ලද්දක් නොවන බව මෙම කරුණු සාක්ෂි දරයි.

මේ පිළිබඳව ඉස්ලාමීය පාලනය යටතේ පැවති රටවල් කිහිපයක විස්තර විමසා බලමු.

## ස්පාඤ්ඤය

මුස්ලිම්වරුන් ස්පාඤ්ඤය අවුරුදු 800 ක් පාලනය කළහ. මෙම දීර්ඝ කාලය තුළ අසිපත යොදා ගත්තේ නම් සම්පූර්ණ ස්පාඤ්ඤ වැසියන්ම ඉස්ලාමිකයින් වී තිබිය යුතුය. පසු කාලීනව කුරුස යුදකාමීන් විසින් මුස්ලිම්වරුන් ව ස්පාඤ්ඤයෙන් සම්පූර්ණයෙන්ම පලවා හරින ලදී. මුස්ලිම් පාලකයින් අසිපතින් ආගමික හරවා ගැනීම් නොකළ බවට මෙය පැහැදිලි ඓතිහාසික සාක්ෂියක් නොවන්නේ ද?



දැනට ලෝක උරුමයක්ව පවතින ස්පාඤ්ඤයේ කෝර්ඩොබා මුස්ලිම් දේවස්ථානය

## ඉන්දියාව

අවුරුදු දහසක් පමණ මුස්ලිම් වරුන් ඉන්දියාව පාලනය කළහ. අදත් එම රටේ ජනගහනයෙන් 80%ක් මුස්ලිම් නොවන්නන් වීම අසිපත ඉස්ලාමයේ ආගම් ප්‍රචාරක අවියක් නොවූ බවට සාක්ෂියක් නොවන්නේ ද? කරුණාකර සිතා බලන්න.



ඉන්දියාවේ අශෝක රජුගේ පාලන යුගයේ ඉදිකරන ලද මුස්ලිම් පාලන යුගයේ සුරක්ෂිතව තිබූ යුනිස්කෝ ලෝක උරුමයක් වන සන්චි ස්ථූපය

## අරාබි කිතුනුවන්



ක්‍රි.ව. 690 සිට අද වන තෙක් ඊජිප්තුවේ කයිරෝ නුවර සුරක්ෂිතව පැවැතෙන (Hanging Church) කොප්ටික් ක්‍රිස්තියානි දේවස්ථානය

ඉස්ලාමය බිහි වූ අරාබි කරයේ අරාබිවරුන් අතර ආරම්භයේ සිට අද දක්වා මිලියන 14 ක් පමණ වූ කොප්ටික් අරාබි කිතුනුවන් ජීවත් වෙති. අසිපත එදත් අදත් ඉස්ලාමයේ ප්‍රචාරක අවියක් වූවා නම් මෙම අරාබි කොප්ටික් කිතුනුවන් ආරම්භයේ සිට අද දක්වා ඉස්ලාමීය අරාබි කරයේ කෙසේ නම් ආරක්ෂා සහිතව ජීවත් විය හැකි වන්නේ ද? ජාත්‍යන්තර මාධ්‍ය අපට නිරතුරුව ගෙන හැර දක්වන්නේ මෙයට හාත්පසින්ම ප්‍රති විරුද්ධ තොරතුරුය. මෙයට ප්‍රධාන හේතුව බටහිර මාධ්‍ය සහමුලින්ම අයිති වී ඇත්තේ ඉස්ලාම් විරුද්ධ යුදෙව්වන්ට වීමයි. මේ හේතුව නිසාම බටහිර මාධ්‍ය විසින් සෑම විටම ඉදිරිපත් කරනුයේ ඉස්ලාම් විරෝධී ප්‍රචාරයන්ය.

සදාම් හුසෙයින් ඉරාකයේ ජනාධිපතිව සිටි කාල වකවානුවේදී එහි උප ජනාධිපති හා විදේශ ඇමැති ලෙස කටයුතු කළේ '**තාරික් අසීස්**' නම් කිතුනුවාය. පලස්තීන කැබිනට් මණ්ඩලයේ අධ්‍යාපන ඇමැති ධූරය දරන්නේ මහාචාර්ය '**හනාන් අෂ්රාවි**' මහත්මියයි. ඇය ද අරාබි කිතුනුවරියකි. ඊජිප්තු කැබිනට් මණ්ඩලයේ ඇමැති වරයෙකුව සිට පසුව එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ප්‍රධාන ලේකම් ධූරය දැරූ '**බුට්රෝස් බුට්රෝස් ගාලි**' ද අරාබි කිතුනුවෙකි.

මුස්ලිම් පාලනය යටතේ අන් දහම් වලට දී තිබූ ප්‍රමුඛතාවය හුවා දැක්විය හැකි උදාහරණ රාශියක් මෙලෙස ගෙන හැර දැක්විය හැක.

ඉස්ලාමීය ඉගැන්වීම් හි යථාර්ථය පිළිබඳ අවබෝධයකින් තොරව නගන්නා වූ චෝදනා පදනම් විරහිත බව මෙම සත්‍යය තොරතුරු විමර්ශනය කිරීමෙන් ඕනෑම අයෙකුට පැහැදිලි වනු ඇතැයි විශ්වාස කරන්නෙමු. අනවබෝධය තුරන් කරමු. අන්‍යෝන්‍ය අවබෝධය තුළින් එකිනෙකාගේ වත් පිළිවෙත් වලට ගරු කරමින් සුහදත්වය හා සහෝදරත්වය මත පදනම් වූ සාමකාමී ශ්‍රී ලංකාවක් ගොඩ නගන්නට සාමූහිකව කටයුතු කරමු.

සියලු දහම් හි අනුගාමිකයින් හා අනුගාමිකයින් යැයි කියා ගන්නා පිරිස අතර අන්තවාදීන් හෝ දැඩි මත දාරීන් සිටිය හැක. මෙය සියලු දහම් වලට පොදු වූ තත්ත්වයකි. මෙවන් සුළු පිරිසක් අප රට තුළත් සිටින බව අප සැවොම දන්නා කරුණකි. මෙවන් පිරිස් හඳුනාගෙන ඔවුන්ගේ හානි කර ව්‍යායාමයන් පරාජයට පත් කිරීමට කටයුතු කිරීම ශ්‍රී ලංකාවාසී අප සැමගේ වගකීමක් ලෙස අපි දකින්නෙමු.

## ප්‍රචාරක කටයුතු මගින් දහම් පැතිරීම

සෑම දහමක්ම ප්‍රචාරක කටයුතු මගින් තම ව්‍යාප්තිය ඇති කර ගත්තාක් මෙන් ඉස්ලාමය ද තම ප්‍රචාරක කටයුතු මගින් ව්‍යාප්ත වූ බව සත්‍යයකි. නමුත් අන් දහම් අපහාසයට ලක් කිරීම හෝ දහම සම්බන්ධව කිසිම බලපෑම් කිරීම හෝ සහ මුලින්ම නොකළ යුතු බව පහත සඳහන් අල් කුර්ආන් වැකි අවධාරණය කරමින් සිටියි. මෙමගින් චින්තන නිදහස සහතික කිරීමක් ඉස්ලාමීය ඉගැන්වීම් ඉදිරිපත් කරයි.

***"අල්ලාහ් හැර ඔවුන් කුමක් අයදිමින් නමදින්නේ ද එයට නුඹලා අපහාස නොකරවු."*** (අල් කුර්ආන් 6/108)

***"දහම සම්බන්ධව බලකිරීමක් නොමැත."*** (අල්-කුර්ආන් 2/256)

***"එබැවින් (නබිවරය) නුඹ උපදෙස් දෙවු. සැබැවින්ම නුඹ හුදෙක් උපදෙස් දෙන්නෙකු පමණය. ඔවුන් කෙරෙහි නුඹ බල කරන්නෙකු නොවේ."*** (අල් කුර්ආන් 88 / 21-22)

මෙවන් චර්යා ධර්මයන් අනුගමනය කරමින් ප්‍රචාරක කටයුතු වල යෙදීම හේතුවෙන් ඉස්ලාමය එක්තරා ප්‍රමාණයකට ව්‍යාප්ත වූ බව සත්‍යයකි.

අපගේ ව්‍යවස්ථාව තුළින් ද දහමක් අනුගමනය කිරීමේ හා ප්‍රචාරණය කිරීමේ නිදහස සහතික කොට ඇත.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වැනි පරිච්ඡේදයේ මූලික අයිතිවාසි කම් පිළිබඳ කොටසේ 10 හා 14 (1) වැනි වගන්තීන් හි පහත සඳහන් අයුරු සටහන් කොට ඇත.**

3-10 "සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද, ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළු ව සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය."

3 - 14. (1) "සෑම පුරවැසියකුටම - ( ඉ) එකලාව හෝ අන් අය හා සමග, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට, ( ඊ) එකලාව හෝ අන් අය හා සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිතා කිරීමේ නිදහසට, හිමිකම ඇත්තේ ය."

ඉස්ලාමය අසිපතින් ව්‍යාප්ත කරන ලද්දක් යන පදනම් විරහිත චෝදනාව පිළිබඳව ජාත්‍යන්තර කීර්තියට පත් ඉතිහාසඥයෙකු වූ 'ඩි ලාසි ඔ'ලිඅරි' විසින් රචිත "Islam at the cross road by De Lacy O'Lear" (Page 8) නම් වූ ග්‍රන්ථයෙන් පහත සඳහන් කොටස උපුටා දක්වන්නට කැමැත්තෙමු.

"History makes it clear however, that the legend of fanatical Muslims sweeping through the world and forcing Islam at the point of the sword upon conquered races is one of the most fantastically absurd myth that historians have ever repeated."

**පරිවර්ථනය** - "භක්තියෙන් උමතු වූ මුස්ලිම්වරුන් ලොව වටා තම පාලනයට යටත් වූ රටවල් හි ජනයාව අසිපතින් බිය ගන්වා ඉස්ලාමය වැළඳ ගන්නා ලෙස බල කළ බව ඉතිහාසඥයින් විසින් නිරතුරුව පැවසූ ජනප්‍රවාදය අති අභූත මිත්‍යා පුරාවෘත්තයක් බව ඉතිහාසය විසින් පැහැදිලි කොට ඇත."

පහත සඳහන් ආකාරයට බුදු දහමේ ව්‍යාප්තියට ද ප්‍රචාරක කටයුතු ඉවහල් වී ඇති ආකාරය දැනගත හැකිය.

"මහාවග්ගපාලි" වාර්තා කරන අන්දමට බුදු දහම මුලින්ම අවබෝධ කර ගනු ලබනුයේ පංච වග්ගිය භික්ෂූන් වහන්සේ විසින් ය. ඉන් පසු බහුජන හිත සුව පිණිස ප්‍රථම ධර්ම දූත කණ්ඩායම ගම්, නියම්, දනව් සිසාරා ධර්ම ප්‍රචාරය කිරීමෙන් බුදු දහම ව්‍යාප්ත කරවීමේ මුල්ම පියවර තබන ලදී. ඉන් පසු බුදු රජාණන් වහන්සේ ද උරුවෙල් දනව්වට වැඩමවා උරුවෙල කාශ්‍යප, ගයා කාශ්‍යප, නදී කාශ්‍යප යන තුන්බෑ ජටිලයන් ප්‍රධාන දහසක් පිරිස දමනය කොට පැවිදි කරවා ධර්ම ප්‍රචාරය සඳහා පිටත් කර යැවූහ. මුල් කාලීන ධර්ම දූතයන් වහන්සේගේ අප්‍රතිහත ධෛර්යය, වාග් චාතුර්යය හා අපරිමිත කුසලතාව නිසාම ගිහි පැවිදි විශාල පිරිසක් මෙම නව දහම වැළඳ ගත්හ. රාජ රාජ මහාමාත්‍යයන් පමණක් නොව ගොවි, කම්කරු ආදී සාමාන්‍ය ජනතාව ද විශාල වශයෙන් මෙම නවමු දර්ශනය හා ප්‍රතිපදාවෙහි අනුගාමිකයෝ වූහ. ගිහි ජනතාව බහුල වශයෙන් බෞද්ධ ආගමිකයන් වීම ශාසන ඉතිහාසයේ සුවිශේෂී සංසිද්ධියක් වශයෙන් පෙන්වා දිය හැකිය.

ක්‍රි. ව. 5 ශත වර්ෂයේ ශ්‍රී ලංකාවේ රචිත මහාවංශය වැනි ග්‍රන්ථ තුළ බුදු රජාණන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම වූ බව වාර්තා වුවත්, ඒ සම්බන්ධව කිසිදු සටහනක් මුල් පාලි ත්‍රිපිටක ග්‍රන්ථ තුළ දැකිය නොහැකිය. ඒ අනුව භාරතයේ මධ්‍ය දේශයට පමණක් සීමා වී තිබුණු බුදු සමය ජාත්‍යන්තර රාජ්‍යයන්ට දායාද කර දෙනුයේ ධර්මාශෝක මහාධිරාජයා විසින් ය. ක්‍රි. පූ. 3 වැනි සියවසේ තෙවැනි සංගායනාවෙන් පසු මොග්ගල්ලිපුත්ත තිස්ස මහතෙරුන්ගේ උපදේශකත්වයෙන් සිදු වූ මෙම මහඟු ඓතිහාසික ශාසනික කර්තව්‍යය බුදු දහම ජාත්‍යන්තරකරණයේ මුල්ම පියවර වශයෙන් පෙන්වා දිය හැකිය. භාරතය තුළත් ඉන් බැහැරත් වූ ප්‍රාදේශීය හා රාජ්‍යයන් 9 කට ධර්ම දූත කණ්ඩායම් පිටත් කර යැවීමෙන් වර්තමානයේ පවා ලංකාව, තායිලන්තය, බුරුමය, ලාඕස්, කාම්බෝජ යන රටවල් ථේරවාද බුදු සමයේ මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියා කරන ආකාරය ප්‍රශංසනීයයි. බුදු දහම හා ජාත්‍යන්තර සම්බන්ධතාව ගවේෂණය කිරීමේදී මීළඟට වැදගත් වනුයේ ක්‍රි. පූ. ප්‍රථම ශත වර්ෂයේ පශ්චාත් භාගයේ හෝ ක්‍රි. ව. මුල් භාගයේදී පමණ බුදු සමය මධ්‍යාසියාව හරහා චීනය, කොරියාව හා ජපානය යන රටවල්වලට පැතිරී යැමයි." (ආචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය.
(http://dahamvila11.blogspot.com/p/blog-page_7.html)

## ශ්‍රේෂ්ඨ චර්යාවන් මගින් දහම් ව්‍යාප්තිය

දහම් ව්‍යාප්තිය සිදු වූ ක්‍රමවේදයන් අතුරින් වඩාත් ප්‍රචලිත ව ඇත්තේ ප්‍රචාරක කටයුතු ය. විශේෂයෙන්ම ඉස්ලාමීය ව්‍යාප්තියට බලපෑ වැදගත් මගක් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම අපගේ වගකීම ලෙස සලකන්නෙමු. මේ පිළිබඳව ඇති වැදගත් ඓතිහාසික තොරතුරු කිහිපයක් පහතින් දක්වා ඇත්තෙමු.

මුහම්මද් නබි තුමාණන්ගේ උපන් භූමිය වූ මක්කා නගරයේදී එතුමාණන්ට ඉස්ලාම් විරෝධීන්ගෙන් අසීමිත හිරිහැර හා තාඩන පීඩනයන්ට මුහුණ පෑමට සිදු විය. මෙම සියලු හිරිහැර වලින් ඉස්ලාමයේ වර්ධනය නැවැත් වීමට නොහැකි වූ අවස්ථාවේ දී ඔවුන් එතුමාණන්ව ඝාතනය කරන්නට කුමන්ත්‍රණ කළහ. මෙම තත්ත්වය හේතුවෙන් ඔහුට මක්කා නගරය අතහැර මදීනා නගරය වෙත දේශාන්තරණය කරන්නට සිදු විය.

මදීනා නගරයේ දී එතුමන්ට මුස්ලිම් වරුන් ලෙස පෙනී සිටි ඉස්ලාම් විරෝධී කුමන්ත්‍රණ කරුවන්ගෙන් බොහෝ හානි සිදු විය. මේ බව එම නගරයේ විසූ සැවොම දැනුවත්ව සිටියහ. මෙම ව්‍යාජ මුස්ලිම් කුමන්ත්‍රණ කරුවන් අතුරින් වඩාත්ම හානිකර චරිතය වූයේ අබ්දුල්ලාහ් ඉබ්නු උබයි නැමැත්තාය. මෙතරම් හානිකර අයුරින් කටයුතු කළ පුද්ගලයා මිය ගිය අවස්ථාවේ මුහම්මද් තුමාණන් විදහා දැක් වූ මිනිසත්කමේ අති ශ්‍රේෂ්ඨ චර්යාවන් දුටු බනූ කස්රජ් ගෝත්‍රිකයින්ගෙන් දහසකට වඩා වැඩි පිරිසක් ඉස්ලාමය වැළඳ ගත්හ. ඉස්ලාමිකයින්ගේ මෙම ශ්‍රේෂ්ඨ චර්යාවන් ඉස්ලාම් ව්‍යාප්තියේ කැපී පෙනෙන සාධකයක් ලෙස දැක්විය හැක.

මොන්ගෝලියානු අධිරාජයාව සිටි ගෙන්ගිස්කාන් විසින් තම ආක්‍රමණික හමුදාවන් මෙහෙයවා ආසියාවේ අති විශාල රටවල් ප්‍රමාණයක් ඔහුගේ ආධිපත්‍ය යටතට ගෙන එන ලදී. මුස්ලිම් රටවල් කිහිපයක් ද ඔහුගේ පාලනය යටතට පත්විය. දහ තුන්වන සියවස ආරම්භයේ ගෙන්ගිස්කාන් ගෙන් පටන් ගත් මොන්ගෝලියානු අධිරාජ්‍යය, ඔහුගේ පරපුර විසින් තවත් රටවල් කිහිපයක් ආක්‍රමණය කරමින් එය වඩාත් වර්ධනය කරන්නට කටයුතු කරන ලදී. මෙම අධිරාජ්‍යය තුළ විසූ ජනයා ඔවුන්ගේ බරපතල කෲරත්වයට හා හිංසනයට භාජනය වූහ. මෙම ආක්‍රමණයන් හේතුවෙන් ඉස්ලාමීය රටවල් කිහිපයක් ද මොන්ගෝලියානු අධිරාජ්‍යයේ පාලනයට යටත් විය.

මොන්ගෝලියානු පාලකයින් විසින් අසීමිත අපරාධයන් සිදු කරමින් කටයුතු කරද්දී ඔවුන්ට අලුත් අත්දැකීමක් ලබාගැනීමේ දොරටු විවෘත විය. සිරගත කොට සිටි මුස්ලිම් වරුන්ට වධහිංසා පමුණුවමින් කෲරකම් කරද්දී ඔවුන් හැසිරුණු ආකාරය මොන්ගෝලියානුවන්ගේ විශේෂ අවධානයට යොමු විය. මුස්ලිම් සිර කරුවන් විසින් සිර ගෙදර නිලධාරීන්ගේ සියලු පහරදීම් විඳ දරාගෙන තමන්ට පැවරී තිබූ සියලු කටයුතු නිසි ලෙස ඉටු කරන ලදී. මෙලෙස විඩාපත්ව සිටි මුස්ලිම් සිර කරුවන් රාත්‍රී කාලය පුරාවට සලාතයෙහි (ඉස්ලාමීය නැමදුමෙහි) යෙදී සිටිනු දක්නා ලදී. මුස්ලිම්වරුන් සමඟ සටන් පැවති අවස්ථාවන්හිදීත් සටනේ උග්‍රත්වය නොතකා සලාතය ඉටු කරනු මොන්ගෝලියානුවන් දැක තිබිණි. මුස්ලිම්වරුන්ගේ මෙම භක්ති වන්ත හා

සාරධර්ම පිරි හැසිරීම මොන්ගෝලියානුවන්ගේ බලවත් විමතියට හේතු විය. මේ අතරතුර සුවිශේෂී සිදුවීම් කිහිපයක් සිදු විය. මේ සියල්ල කෲර මොන්ගෝලියානුවන්ව අදහා ගත නොහැකි විශ්මයට පත් කරවන ලදී. මෙවන් සිදුවීම් කිහිපයක් විමසා බලමු.

එක් මොන්ගෝලියානු බන්ධනාගාර පාලකයෙකු ඔහු යටතේ සිටි සිර කරුවන්ට දැඩි ලෙස කස පහර දෙන්නෙකුව සිට ඇත. සිරකරුවන් ව දම්වැලකින් බැඳ තැබීම සිරිතක් ව තිබූ අතර ආහාර ගන්නා අවස්ථාවේ පමණක් එක් අතක් ලිහා දැමීම සිදු කර ඇත. දිවා ආහාරය ගනිමින් සිටි අවස්ථාවේ බන්ධනාගාර පාලකයාගේ කුඩා දරුවා ළිඳකට වැටී ඇත. එම ස්ථානයට සමීප තැනක ආහාර ගනිමින් සිටි මුස්ලිම් සිර කරුවෙක් නිදහස් ව තිබූ තම එක් අතත් සමඟ ළිඳට පැන මෙම කුඩා දරුවාගේ ජීවිතය බේරා ගන්නට ඉදිරිපත් වී ඇත. තමා විසින් අසීමිත වධ හිංසාවන් පමුණුවනු ලැබූ සිරකරුවෙකු විසින් දිවි පරදුවට තබා තම දරුවාගේ ජීවිතය බේරා දීමට ඉදිරිපත් වීම බන්ධනාගාර පාලකයාට අදහා ගත නොහැකි සිදුවීමක් විය. මෙම සිදුවීමෙන් පැහැදුණු බන්ධනාගාර පාලකයා ඉස්ලාමය වැළඳ ගත්තේය.

තවත් වරෙක ෆිරෝස් මව්ලවි නමැති ඉස්ලාමීය විද්වතා මොන්ගෝලියානු බන්ධනාගාරයක සිර කරුවෙකු ව සිටියේය. බන්ධනාගාරගතව සිටි අනෙකුත් බොහෝ සිර කරුවන්ව මෙම ඉස්ලාමීය විද්වතාගේ මැදිහත්වීම මගින් යහමගට ගෙන ඒමට හැකි වීම පිළිබඳව බන්ධනාගාර පාලකයින් එතුමා පිළිබඳව පැහැදීමකින් සිටියහ. මේ අතරතුර මොන්ගෝලියානු අධිරාජයා විසින් එතුමාට මරණ දඬුවම නියම කරන ලදී. නමුත් මෙම ඉස්ලාමීය විද්වතා තමන්ට එක් රාත්‍රියකට පමණක් නිදහස ලබා දෙන ලෙස බන්ධනාගාර පාලකයින්ගෙන් ඇයද සිටියේය.

"මට එක් රාත්‍රියකට පමණක් පිටතට ගොහින් එන්නට නිදහස ලබා දෙන්න. අනාථ දරුවෙකුගේ මුදල් ප්‍රමාණයක් ආපසු දීමට ඇත. එය දුන් විගස උදෑසනම මා නොවරදවාම ආපසු එන්නම්" යනුවෙන් ඔහු පවසා සිටියේය. බන්ධනාගාර පාලකයා ඔහුව නිදහස් කොට යන්නට ඉඩ හැරියේය. මෙම ඉස්ලාමීය විද්වතා පසු දින උදෑසනම පොරොන්දු වූ පරිදි ආපසු පැමිණියේය. "ඔබට අද මරණ දඬුවම ක්‍රියාත්මක කරන බව දැන සිටියදීත් ඔබ ආපසු පැමිණියේ ඇයි ?" කියා සිරගෙදර පාලකයා විමසා සිටින ලදී. මෙයට පිළිතුරු දෙමින් "අපගේ මුහම්මද් නබි තුමාණන් අපට උගන්වා ඇත්තේ පොරොන්දු ඉටු කරන ලෙසයි. මා ආපසු එන බව ඔබට පොරොන්දු වූ නිසා මා ආපසු පැමිණියා" යැයි ඉස්ලාමීය විද්වතා පවසා සිටියේය. එතුමාගේ අවංකත්වය හා ආගමික භක්තිය පිළිබඳව පැහැදුණු සිරගෙදර පාලකයා එතුමාව නිදහස් කොට තමා ද රහසිගතව ඉස්ලාමය වැළඳ ගන්නා ලදී.

මෙලෙස මුස්ලිම්වරුන් සමඟ කටයුතු කිරීමට අවස්ථාව උදා වූ අති විශාල මොන්ගෝලියානුවන් පිරිසක් ඉස්ලාමය වැළඳ ගන්නා ලදී. ඉතා කෲර හුලාගු කාන්ගේ පුතනුවන් දෙදෙනෙකු වූ තකුදාර් කාන් (සුල්තාන් අහමඩ්) හා අල්ජයිටෝ කාන් ක්‍රි. ව. 1281 දී ඉස්ලාමය වැළඳ ගත්හ. දෙදෙනාම පිළිවෙලින් පසුව රජවරුන් බවට පත්වූහ. මෙම මොන්ගෝලියානු රජවරුන් හා

කුමාරයින් තමන්ගේ අමාත්‍ය මණ්ඩලයට හා නිලධාරීන්ට ඉස්ලාමය වැළඳ ගන්නා ලෙස ආරාධනා කළ අවස්ථාවේ සැවොම විමතියට පත්කරමින් හෙළිදරවු වූ කරුණක් වූයේ ඔවුන්ගෙන් බහුතරයක් ඒ වනවිටත් රහසිගතව ඉස්ලාමය වැළඳ ගෙන සිටීමය. රජවාසලින් කරන ලද ප්‍රසිද්ධ නිවේදනයකින් පසුව මොන්ගෝ-ලියානු සන්නද්ධ හමුදා සාමාජික-යින් මෙන්ම සිවිල් වැසියන් ද දහස් ගණනින් ඉස්ලාමය වැළඳ ගන්නා ලදී. එදින මොන්ගෝලියානු අධිරාජ්‍යය උත්සවශ්‍රීයෙන් ඉතිරීගිය දිනයක් විය. සියළුම මුස්ලිම් සිරකරුවන් ව නිදහස් කරන ලදී. ඉස්ලාමීය රජ්‍යයන් මත අති භයානක භීෂණයක් මුදා හරිමින් එම රටවල් තමන්ගේ යටත් විජිත බවට පත් කර ගත් මොන්ගෝලියානු අධිරාජ්‍යයේ විශාල පිරිසක් ඉස්ලාමය වැළඳ ගැනීමට හේතු වූයේ මුස්ලිම්වරුන්ගේ ශ්‍රේෂ්ඨ චර්යාවන් මිස අසිපත නොවන බව මෙයින් පැහැදිලිවනු ඇතැයි විශ්වාස කරන්නෙමු.


මොන්ගෝලියන් කුමරුන් අල්-කුර්ආනය ඉගෙන ගන්නා අයුරු දැක්වෙන සිතුවමක්

ඉහත මොන්ගෝලියානුවන්ගේ විස්තර උපුටා ගනු ලැබුයේ පහත සඳහන් මූලාශ්‍රයෙනි.

(Stories of the World – Published by Al-Asr Publication – New Delhi – India)


**ක්‍රි.ව.1259 කාල වකවානුවේ මොන්ගෝලියානු අධිරාජ්‍ය දැක්වෙන සිතියම**




ඉහත සිතියම දෙස අවධානයෙන් නිරීක්ෂණය කිරීමේ දී පැහැදිලි වන වැදගත්ම සාධකය වන්නේ මෙවන් අති විශාල භූමි භාගයක ව්‍යාප්තව තිබූ

මොන්ගෝලියානු අධිරාජ්‍යයේ අති බහුතරයක් ඉස්ලාමය වැළඳ ගත්තේ අසිපතින් නොව ඉහත පැහැදිලි කරන ලද ඉස්ලාමිකයින්ගේ ශ්‍රේෂ්ඨ චර්යාවන් හේතු කොටගෙන බව පැහැදිලිවම සනාථ වන කරුණකි.

ඉහත සියලු කරුණු සමස්තයක් වශයෙන් සමාලෝචනය කර බැලීමේ දී ඉස්ලාමය බලෙන් ව්‍යාප්ත කරන ලද්දක් නොවන බව මධ්‍යස්ථ ඕනෑම අයෙකුට ඉතාම පැහැදිලිව අවබෝධ කර ගත හැක්කක් බව විශ්වාස කරන්නෙමු. එනිසා ශ්‍රී ලංකාව ඉස්ලාමීය රටක් බවට පත් කර වන්නට කිසිදු ආකාරයක රහසි ගත කුමන්ත්‍රණයක අප නොමැති බව අවධාරණයෙන් යුක්තව පවසන්නට කැමැත්තෙමු.



පෘතුගීසීන්ට එරෙහිව පෙළ ගැසුනු කාත්තණ්කුඩි ප්‍රදේශයේ යෝනකවරුන්ගෙන් සැදුම් ලත් ඔටු හමුදාව දැක්වෙන පැරණි සිතුවමක්

ශත වර්ෂ ගණනාවක් තිස්සේ පැවත එන සිංහල මුස්ලිම් සමගිය හා සුහදත්වය බිඳ දැමීම මෙවන් අනිසි පදනම් විරහිත චෝදනාවන්ගේ අරමුණ බව ඉතා හොඳින් පැහැදිලිවන කරුණකි. එනිසා අපි සත්‍යය අවබෝධ කර ගනිමු. දැනුවත් වෙමු, වෛරය, ක්‍රෝධය තුරන් කරමු. සාමකාමී, හා සමගියෙන් බැඳුනු මව් බිමක් ගොඩ නගමු. ඉදිරි පරපුරට සාමකාමී හා සෞභාග්‍යයෙන් යුත් රටක් ගොඩ නගන්නට අවශ්‍ය අඩිතාලම දමන්නට අදම අධිෂ්ඨාන කර ගනිමු.

තමන්ගේ ආගමික හා වාර්ගික අනන්‍යතාවය රැක ගනිමින් හා අන් අයගේ ආගමික හා වාර්ගික අනන්‍යතාවයට ගරුකරමින් කටයුතු කරන ශ්‍රේෂ්ඨ ආදර්ශමත් රටක් ලෙස අපගේ මාතෘ භූමිය ගොඩ නඟමු.

වරින් වර අප අතර පැන නඟින සැකසංකා මතභේද හා එකිනෙකා පිළිබඳව වූ දුර්මත සංවර හා සාමකාමී ලෙස සාකච්ඡා කොට විසඳ ගැනීම අවශ්‍ය පසු බිම ගොඩ නඟමු.

අන්‍යෝන්‍ය අවබෝධය ගොඩ නැගීම පදනම් කරගෙන සකස් කෙරෙන මෙම "සමාජ සංවාද" ලිපි පෙළෙන් අප අපේක්ෂා කරන්නේ ශ්‍රී ලාංකේය සැමට සුහදත්වය සාමය හා සහෝදරත්වයෙන් සපිරි අලංකාර සමාජ පරිසරයක් ගොඩ නැගීමටය. මෙම උදාර අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීම පිණිස කරුණාකර අප සමග අත්වැල් බැඳ ගන්නා ලෙස ගෞරව පූර්වකව ආරාධනා කරන්නෙමු.